# Project 188
# 188 වන ව්‍යාපෘතිය

DP EDUCATION

**Coding School**




වෙබ් පිටුව බලන්න


Glitch ආරම්භ කරන්න

මේ සඳහා ඔබ විසින් 187 වන ව්‍යාපෘතිය දක්වා වැඩිදියුණු කරගන පැමිණි වෙබ් පිටුවම භාවිතා කරන්න.

LIVEWORKSHEETS

වෙබ් පිටුවේ content එකට buttons සහ form එකක් add කරගන්නා ආකාරය බලමු

- මේ සඳහා ඔබ විසින් 187 වන ව්‍යාපෘතිය දක්වා වැඩිදියුණු කරගන පැමිණි වෙබ් පිටුවම භාවිතා කරන්න. එම project එක තවදුරටත් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේදී සිදු කරයි.




- පහත ආකාරයට වෙබ් පිටුව තුළ newsletter එකක් නිර්මාණය කරගමු.




- Newsletter එකක් යනු වෙබ් පිටුවෙහි අලුත් දෑ පිළිබඳව එහි පරිශීලකයන්ට දැනුම් දීම සඳහා ඔවුන් register කරගන්නා form එකකටයි. එහි නිදර්ශකයක් අපගේ වෙබ් පිටුවටද ඉහත ආකාරයට add කරගමු.
- පළමුව පහත ආකාරයට html tags සකස් කරගමු. ඔබ ඉහත ව්‍යාපෘතියේදී නිර්මාණය කරගත් content එකට පහළින් පහත පරිදි div tag එකක් add කරගන්න.

LIVEWORKSHEETS

```
<div class="form-container">
  <h1>NEWSLETTER</h1>
  <form>
    <input type="email" placeholder="Enter your email">
    <button>Subscribe</button>
  </form>
</div>
```

- ❖ Div tag එක සඳහා form-container ලෙස class name එක ලබදෙන්න.
- ❖ ඉන්පසු h1 tag එකක් තුළ NEWSLETTER යන නම ඉහලින් දර්ශණය වීමට සකස් කරන්න.
- ❖ එයට පහළින් form tag එකක් භාවිතයෙන් form එකක් නිර්මාණය කරගමු.
- ❖ Form tag එක තුළ form එක තුළ ඇතුළත් වන fields add කරගන්න.
- ❖ මෙහි input field එකක් හා button එකක් ඇතුළත් වේ.
- ❖ Input field එකෙහි placeholder එක මගින් user හට එය තුළට ඇතුළත් කළ යුත් අගය කුමක්ද යන්න දක්වයි.
- ❖ එවිට පහත ආකාරයට සරල form එකක් ඔබට දැකත හැකි වනු ඇත.




- ❖ දැන් අප CSS භාවිතා කර එම form එක අලංකාර කරගමු.

- ❖ පළමුව form-container නැමැති class name එකට අදාළ CSS පහත පරිදී සකස් කරගන්න.

```
.form-container {
  margin: 0 auto;
  padding: 10px;
  background-image: url("https://cdn.glitch.global/83dec6c6-d9f9-4684-b24e-b3369ec788a5/mountains-190055_1280.jpg?v=1703667697351");
  background-repeat: no-repeat; /* Set background image to not repeat */
  background-size: cover; /* Optional: Cover the entire container */
  background-position: center center;
  height: 50vh;
  display: flex;
  flex-direction: column;
  justify-content: center;
  align-items: center;
}
```

LIVEWORKSHEETS

- මෙහි background image එක සඳහා ඔබට අවශ්‍ය image එකක් assets folder එකට add කරගන්න. භාවිතා කර ඇති image එකෙහි link එක පහත දක්වා ඇත.
  https://cdn.glitch.global/83dec6c6-d9f9-4684-b24e-b3369ec788a5/mountains-190055_1280.jpg?v=1703667697351

- background-repeat: no-repeat;
  background-size: cover;
  මේ මඟින් image එක කුඩා වුවත් ඉඩ පිරවීමට නැවත නැවත image එක repeat වීම නවත්වයි. එසේ නොමැති නම් පහත පරිදි image එක repeat වේ.




- background-position: center center; මේ මඟින් div tag එකෙහි ප්‍රමාණය image එකෙහි ප්‍රමාණය නොවුනත් image එකෙහි මැද div tag එක තුළින් දර්ශණය කිරීම සිදු කරයි. එය යොදා නොගතහොත් default view එක ලෙස පහත පරිදි image එකෙහි top එක පමණක් පෙන්වයි.




- height: 50vh; මේ මඟින් සම්පූර්ණ dev tag එකෙහි උස තීරණය කරයි.

LIVEWORKSHEETS

- display: flex;

  flex-direction: column;

  justify-content: center;

  align-items: center; මේවා මගින් div tag එක තුළ පවතින සියලු elements div tag එකෙහි මැදට වන ලෙස සකස් කරයි.


  එසේ ඒවා නොමැති නම් පහත පරිදී default ලෙස සියලු elements වම් පසට වන ලෙස සැකසේ.




- ඉන්පසුව form-container div tag එකෙහි ඇති input tag සඳහා CSS සකස් කරමු. අපගේ මෙම form එකෙහි එක input tag එකක් පමණක් ඇති නිසා පහත පරිදී CSS සකස් කළ හැකි වේ. කිහිපයක් වේ නම් ඒවා එකිනෙකට වෙනස් වේ නම් ඒ සඳහා class name යෙදිය යුතු වේ. නමුත් මෙහිදී 1ක පමණක් ඇති නිසා පහත ආකාරයට සකස් කරමු.

```
.form-container input {
  width: 400px;
  height: 50px;
  border: solid rgb(255, 149, 1);
  border-radius: 15px 0 0 15px;
  font-size: 20px;
}
```

- border-radius: 15px 0 0 15px; මෙ මගින් border එක round කිරීම input tag එකෙහි මුලු දෙකක් පමණක් කළ හැකිය.




LIVEWORKSHEETS

- Input tag එක තුළ ඇති placeholder එකෙහි CSS වෙනස් කිරීමට පහත පරිදි code කළ යුතුය.
  එය විශේෂ ආකාරයක් බැවින් හොඳින් අධ්‍යයනය කරන්න.

```
.form-container input::placeholder {
  padding: 10px;
}
```

- Subscribe නැමැති button එක සඳහා CSS පහත පරිදි වේ.

```
.form-container button {
  width: 200px;
  height: 58px;
  border: solid #ff8c00;
  border-radius: 0 15px 15px 0;
  background-color: #ff8c00;
  font-size: 20px;
}
.form-container button:hover {
  cursor: pointer;
}
```

- එහි ඇති h1 tag එක සඳහා පහත CSS add කරමු.

```
.form-container h1 {
  font-size: 55px;
  font-family: "Franklin Gothic Medium", "Arial Narrow", Arial, sans-serif;
  color: rgb(225, 255, 0);
  -webkit-text-stroke: 1px black;
}
```

- font-family: "Franklin Gothic Medium", "Arial Narrow", Arial, sans-serif;
  මේ මඟින් font එක වෙනස් කරයි.
- -webkit-text-stroke: 1px black; මේ මඟින් අකුරු වටේට outline එකක් නිර්මාණය කිරීම සිදු කරයි.

LIVEWORKSHEETS